**වලපනේ ප්‍රාදේශීය සභාව - 2022**
**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වලපනේ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම , වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වලපනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට එරෙහිව නඩු කටයුතු 04 ක් විභාග වෙමින් පැවතියද ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කර නොතිබුණි. | 2023 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කළ යුතුය. |
| (ආ) | මුදල් අක්‍රමිකතාවක් හේතුවෙන් නිළධාරියෙකුගෙන් රු.3,660,000 ක් අයකර පරීක්ෂණ කටයුතු නිම වන තෙක් තැන්පත් ලේඛනයේ රඳවාගෙන පැවතියද, මුදල් අක්‍රමිකතාවය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2023 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරවු කළ යුතුය. |

#### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජ'නල් අංක 45 සහ 46 අනුව මුලධන ආධාර ගිණුම එකතුව රු.10,211,726 ක් බැර ලෙස සටහන් යොදා තිබුණද, රු.10,311,726 ක් මුදල් හර කර රු. 100,000 ක් වැඩියෙන් දැක්විණි. | 2023 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ රු.1,518,000 කට ණයහිමි කරන ලද ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂයේදී අවලංගු කර තිබියදී තවදුරටත් ණයහිමියන් යටතේ දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළව 2023 වර්ෂයේදී අවස්ථා 14 කදී, ගෙවන ලද රු.1,500,176 ක් ණය හිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි | 2023 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම ලෙස ගිණුම් ගත කර නොතිබුණු රු.3,538,950 ක් සමාලෝචිත වර්ෂය තුළ ලැබීමේදී සමුච්චිත අරමුදලට බැර කළ යුතු වුවද, රු.1,737,500 ක් සමුච්චිත අරමුදලටද රු.1,801,450 ක් වර්ෂයේ ආදායමටද බැර කර තිබුණි. | 2023 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කළ යුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබි තිබුණු රු.4,487,160 ක මුද්දර ගාස්තු ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණු අතර වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.581,950 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශනවල අගය නිවැරදිව හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු.116,168 ක උපාචිත දඩ ආදායමක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණි. | 2023 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කළ යුතුය. |
| (ඊ) | පොදු තැන්පත් යටතේ ගිණුම්ගත කළ යුතු රු.2,408,534 ක රැඳවුම් ගාස්තු ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (උ) | ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය නොකර සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මිළදී ගෙන තිබුණු රු.272,490 ක තොගය වර්ෂයේ වියදමට හර කර තිබුණි. | ගිණුම් තබන්නේ චෝට් ගත කර බැවින් වන අතර අත්තිකාරම් ක්‍රමය දැනට ක්‍රියාත්මක නොවන බව | ගිණුම් නිවැරදිව පිළියෙල කල යුතුය. |

### 1.6.3 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 03 කට අදාළ මූලික පොත් හා උපයෝගි ලේඛනවල ශේෂයන් සමඟ සැසැඳීමේදී රු.24,671 ක නොසැසඳීමක් විය. | මූල්‍ය ප්‍රකාශනයේ නොසැසඳීම 2023 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.16,384,452 ක් වටිනා ගිණුම් ශේෂ 12 ක් වත්කම් ලේඛන සහ උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | 2023 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ශේෂ සනාථ කිරීමට අදාළ උපලේඛන පිළියෙල කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පාර්ලිමේන්තු පනත්<br>------------------------<br>1988 අංක 56 හා 2000 අංක 53 දරණ පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත | සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපාර 11 ක් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | ස්ථාන පරීක්ෂා කර බලා ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ<br>----------------------------------------<br>1988 මැයි 17 දිනැති අංක 1988/22 දරණ චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපල තක්සේරුව වසර 5 කට වරක්වත් සිදුකළ යුතු වුවද, ප්‍රාදේශීය සභාව 2011 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදී ද වරිපනම් බදු අයකර තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර තිබුණද මේ දක්වා තක්සේරුවක් සිදුකර නොතිබුණු බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,153,885 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.17,785,248 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ජංගම ගිණුම් 03 ක මුදල් පොත අනුව ශේෂය රු.17,087,707 ක් පැවතියද, අතිරික්ත මුදල් ප්‍රාදේශීය සංවර්ධනය සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම් වල ශේෂය සැලකිල්ලට ගෙන ඉදිරියේදී එම මුදල් ඵලදායි කාර්යන් සඳහා යෙදවීමට කටයුතු කරන බව | අතිරික්ත මුදල් ප්‍රාදේශීය සංවර්ධනයට යොදා ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කාලය ඉකුත් වූ රු.187,445 ක චෙක්පත් 02 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කරමින් පවතින බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,877,000 | 4,768,063 | 5,327,808 | 3,663,504 | 2,877,000 | 5,218,040 | 2,587,032 | 4,223,249 |
| (ii) | කඩ කුලී | 11,518,000 | 16,184,257 | 2,855,586 | 20,429,782 | 11,449,225 | 5,508,577 | 11,787,174 | 7,101,111 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,456,000 | 2,959,854 | 2,959,854 | - | 4,456,000 | 3,190,480 | 3,416,097 | - |
| (iv) | වෙනත් ආදායම් | 91,103,000 | 14,309,041 | 19,149,245 | 2,660,778 | 88,549,000 | 5,065,540 | 80,556,921 | 7,500,982 |
| | | 109,954,000 | 38,221,215 | 30,292,493 | 26,754,064 | 107,331,225 | 18,982,637 | 98,347,224 | 18,825,342 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| | 2022 ජනවාරි 01 දිනට රු.2,106,298 ක් හිඟ වරිපනම් බදු පැවති අතර දෙසැම්බර් 31 දිනට අය කිරීම රු. 887,778 හෙවත් සියයට 42 ක් පමණක් වුයෙන් වරිපනම් බදු අය කිරීමේ ප්‍රගතිය ප්‍රමාණවත් මට්ටමක නොතිබුණි. | හිඟ කොටස් වශයෙන් අය කිරීමට කටයුතු කරන බව | හිඟ මුදල් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කුලී | | |
| i. | වසර 04 සිට වසර 07 දක්වා කාලයක සිට හිඟව පවතින වලපනේ රාගල, පදියපැලැල්ල පොදු වෙළඳපොළ කඩකාමර 24 ක රු.5,520,389 ක හිඟ කඩකුලී හා 1987 සිට 2019 දක්වා කාල පරාසයක තුළ මස් මාළු කඩ 25 ක රු.1,250,150 ක හිඟ කුලී සමාලෝචිත වර්ෂය අවසාන දිනට අයකර නොතිබුණි. | 1987 වර්ෂයේ සිට 2019 දක්වා පවතින හිඟ අයකර ගැනීමට නොහැකි වි ඇති අතර ඉදිරියේදී කපා හැරීම සඳහා අනුමැතියට යොමු කරන බව | හිඟ මුදල් අය කළ යුතුය. |
| ii. | රාගල හා වලපනේ සතිපොලේ බදුකරුවන් හත්දෙනෙකුගෙන් අවු 03 සිට අවු 35 කාල පරාසය සිට එකතුව රු.848,937 ක බදු කුලී අයකරගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ බදුකුලී අයකළ යුතුය. |

(ඇ) බලපත්‍ර ගාස්තු

--------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපාර 55 කට අයත් වෙළඳ බලපත්‍ර නිකුත් කර නොතිබුණු අතර ඒ හේතුවෙන් රු.55,200 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | 2023 වර්ෂයට අදාළව අයවිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු සියලු වෙළඳ ව්‍යාපාර වලින් අයකර ගැනීමට කටයුතු කරන බව | බලපත්‍ර ගාස්තු අය කළ යුතුය. |

(ඈ) වෙනත් ආදායම්

------------------

| | | | |
|---|---|---|---|
| i. | රථ වාහන නැවතුම්පළ ගාස්තු හා පොදු වැසිකිළි බදු කුලී එකතුව රු. 412,334 ක් වර්ෂ 02 සිට වර්ෂ 08 දක්වා කාලපරාසයක් හිඟව පැවතුණි. | හිඟ අය කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව | හිඟ අය කළ යුතුය. |
| ii. | බල ප්‍රදේශයේ දැන්වීම් පුවරු සම්බන්ධයෙන් කරන ලද නියැදී පරීක්ෂණයේදී රු.131,364 ක දැන්වීම් පුවරු ගාස්තු අයකර නොතිබුණි. | දැන්වීම් පුවරු සඳහා මේ වන විට වටිනාකම් තක්සේරු කර ඇති අතර ලිපි මඟින් අදාල අය දැනුවත් කර අය කර ගැනීමට කටයුතු කරන බව | නිසි ලෙස සමීක්ෂණය කර ගාස්තු රැස්කළ යුතුය. |

(ඉ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 1,219,778 ක් හා මුද්දර ගාස්තු රු.1,441,000 ක් විය. | ඉදිරිපත් කල උපලේඛන සඳහා පමණක් මේ වන විට මුදල් ලැබී ඇති බව | ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 79 සිට 84 වගන්ති වලට අනුව සභාබල ප්‍රදේශය තුළ පොදු කානු ඉදි කිරීම, අළුත්වැඩියා කිරීම හා කාණු සම්බන්ධ සාමාන්‍ය පාලනය ආදී කටයුතු සභාව විසින් ඉටු කර නොතිබුණි. | සංවර්ධන වැඩසටහන් යෝජනා කර නොමැති අතර ප්‍රතිපාදන වෙන් කරද නොමැති බව | පනතේ සඳහන් කාර්යයන් ඉටු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ 27 හා 33 වගන්ති වලට අනුව සමාලෝචිත වර්ෂය තුළ මංමාවත් ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම සඳහා සභා අරමුදල් යොදවා නොතිබුණි. | සංවර්ධන වැඩසටහන් යෝජනා කර නොමැති අතර ප්‍රතිපාදනද වෙන් කර නොමැති බව | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රාදේශීය සභා පනතේ 95 වගන්තියට අනුව මල ප්‍රවාහනය සහ කසල ශෝධනය සඳහා සභාව ගලි රථයක් සභාව සතුව නොතිබුණු බැවින් එම සේවාවන් ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | ගලි රථයක් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කර පළාත් පාලන සහකාර කොමසාරිස්තුමන් වෙත ලිපියක් යොමු කර ඇති බව | - එම - |
| (ඈ) | ප්‍රාදේශීය සභා පනතේ 108 වගන්තිය අනුව කටයුතු කිරීමකින් තොරව ප්‍රාදේශීය සභාව විසින් පිරිපහදු කිරීමකින් තොරව පානීය ජලය බෙදා හැර තිබුණු අතර ජල මීටර් සවි නොකර ස්ථාවර ගාස්තුවක් අයකර තිබුණි. | ප්‍රජා ජල සංවිධානයට මෙම ජල යෝජනා ක්‍රමය පැවරීමට කටයුතු කරමින් පවතින බව | පිරිසිදු පානීය ජලය ලබාදීමට කටයුතු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ගබඩා තොග ඒකක 73 ක්, සභාව සතු රාගල හා කුරුපනාවල ආයුර්වේද මධ්‍යස්ථාන 02 හි අවසන් තොග වටිනාකම සහ පොහොර කිලෝග්‍රෑම් 11,950 ක වටිනාකම ගණනය කර ගිණුම්ගතකර නොතිබුණි. | ලේඛන පරීක්ෂා කර බලා වටිනාකම් නිවැරදිව හඳුනාගෙන 2023 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව | තොග ගිණුම් ගත කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති එකතුව රු.2,056,475 ක යන්ත්‍ර හා උපකරණ 04 ක් හා වාහන 10 ක් වසර 01 සිට වසර 12 දක්වා කාලයක සිට නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | යන්ත්‍ර හා උපකරණ භාණ්ඩ සමීක්ෂණ මඟින් අපහරණය හා වෙන්දේසි කිරීමට කටයුතු කරන බව | උපයෝජනය කිරීම හෝ බැහැර කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ පවතින උප කාර්යාල, පුස්තකාල හා ප්‍රජා ශාලා ගොඩනැගිලි 6 ක් ගවමස් කඩ 4 ක් කසල අංගන ගොඩනැගිල්ල නිසි නඩත්තුවක් හෝ අළුත්වැඩියා කිරීමකින් තොරව අබලන් වී පැවතිණි. | සභාවේ මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතු වී ඇති බව | අළුත්වැඩියා කර නඩත්තු කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ, සේවය හැර ගිය හා මියගිය නිළධාරීන් 19 දෙනෙකුගෙන් රු.611,668 ක ණය ශේෂය අයකර නොතිබුණි. | ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟ ණය ශේෂ අයකර ගත යුතුය. |

**3.6 වාහන පද්ධති කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නාය යාමක් හේතුවෙන් බැකෝ යන්ත්‍රය 2018 නොවැම්බර් 07 දින අනතුරට පත්වී එය යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා, 2019 ජුලි 09 දින පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාල වැඩබිම් අංගනය වෙත භාර දී තිබුණද 2023 පෙබරවාරි 15 දින දක්වා එය අළුත්වැඩියා කර සභාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කටයුතු අවසන් වූ විගස එය සභාව වෙත රැගෙන ඒමට කටයුතු කරන බව | අළුත්වැඩියා නිම කරගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් කාර්යයන් 08 ක්, සමාලෝචිත වර්ෂය තුළ ඉටු කර නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | සැලසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4.2 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 09 සිට සියයට 49 දක්වා ද වියදම් විෂයයන් 05 ක සියයට 12 සිට සියයට 91 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | 2024 අයවැය සකස් කිරීමේදී අයවැය ලේඛනය ඵලදායි කාරකයක් වශයෙන් යොදා ගැනීමට කටයුතු කරන බව | අවශ්‍යතාවය සලකා බලා නිසි අවධානයෙන් අයවැය පිළියෙල කළ යුතුය. |

## 4.3 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කසළ අංගනය වටා දැල් වැට සම්පූර්ණකර නොතිබුණු බැවින් වන සතුන්ගෙන් හානි සිදුවන බව අනාවරණය වු අතර ඝන අපද්‍රව්‍ය කළමනාකරණයකින් තොරව කසළ විවෘත පරිසරයට මුදාහැර තිබුණි. | කසල අංගනයේ මැසි මදුරු නාශක යොදා බේල් යන්ත්‍රය හා බේල් ගබඩා කර ඇති කාමර විධිමත් කර ප්‍රවේශ මාර්ගය හා අවට අලංකාර ලෙස සකස් කරන බව | කසළ කළමනාකරණය විධිමත්ව පවත්වා ගත යුතුය. |

## 4.4 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා 2017 අංක 19 තිරසර සංවර්ධන පනත ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක පිහිටුවාගෙන නොතිබුණි. | මෙම වර්ෂයේ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනිම සඳහා අවශ්‍ය කරන වැඩසටහන් සභාව මඟින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව | පනතේ නියමයන් අනුව කටයුතු කළ යුතුය. |